පොළොන්නරුව මහා නගර සභාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 20 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 28 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 29 දිනද නගරාධිපතිවරයාට යවා ඇත.

**1.2 අභිතකර මතය**

මෙම වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 අභිතකර මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ම.න.ස 10 ලැබීම් හා ගෙවීම් ලේඛනය අනුව මුදල් ශේෂය රු.18,285,781 ක් වුවත් එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.18,720,588 ක් ලෙස රු.434,807 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි ශේෂය ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. එම ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | 2018 ජනවාරි සිට ජූලි දක්වා මාස 07 කට අදාලව තමන්කඩුව ප්‍රාදේශීය සභාව නමින් ලද උසාවි දඩ බිල් කිරීම් රු.8,463,225 කින් මහා නගර සභාවට හිමි හිඟ උසාවි දඩ වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | මහා නගර සභාවට හිමි උසාවි දඩ හිඟ මුදල් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. 2018 වර්ෂයට අදාල මහා නගර සභාවට හිමි උසාවි දඩ වටිනාකම හඳුනාගැනීමට කටයුතු සැලසුම් කරමි. |
| (iii) | 2018 වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලයට අදාල උසාවි දඩ හිඟ ආදායම රු.1,353,471 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. 2018 වර්ෂයේ හිඟ ආදායම අඩුවෙන් සටහන් කිරීම හඳුනාගත් අතර 2020.12.31 දිනෙන් අවසන් ගිණුම් වර්ෂයේදී නිවැරදි කරමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ ජුනි සිට නොවැම්බර් දක්වා මාස 06 කට අදාල උසාවි දඩ හිඟ ආදායම රු.512,333 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර දෙසැම්බර් මාසයට අදාල උසාවි දඩ හිඟ මුදල හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | හිඟ මුදල් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. ජුනි සිට නොවැම්බර් දක්වා ගිණුම් ප්‍රකාශ 2020 වර්ෂයේ ලැබී ඇති අතර දෙසැම්බර් ගිණුම් ප්‍රකාශ ලැබී නොමැත. |
| (v) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. ගිණුම් ප්‍රකාශ 2020 ජූනි මස ලැබී ඇත. එය ලේඛනගත කොට ඇත. |
| (vi) | සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි. | විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සැලසිය යුතුවේ. | පිළිගනිමි. විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරමි. |
| (vii) | පොළොන්නරුව වට රවුම අසල දෙමහල් ගොඩනැගිල්ල බදුදීමෙන් අයවිය යුතු රු.450,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. සංශෝධනය කිරීමට කටයුතු කරමි. |
| (viii) | පොළොන්නරුව වෙළඳ සංකීර්ණයේ ගිණුම්ගත කර තිබූ වටිනාකම රු.264,101,707 ක් වුවද මෙම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා උතුරු මැද ප්‍රධාන ලේකම් කාර්යාලය හරහා වැය කරන ලද මුළු වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබීම නිසා ගොඩනැගිල්ලේ සත්‍ය වටිනාකම මූල්‍ය ප්‍රකාශන මඟින් පෙන්නුම් කර නොතිබුණි. | 2019 දෙසැම්බර් 31 දිනට නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | පළමු අදියර පමණක් අවසන් කර තිබූ බැවින් එහි වටිනාකම ලේඛනගත කර තිබූ අතර 2020 සියලු වැඩ අවසන් බැවින් එහි වටිනාකම රු.660,125,829 ලේඛනගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ix) | සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී පොළොන්නරුව මහා නගර සභා බල ප්‍රදේශයේ සවිකර තිබූ සූර්ය පැනල විදී පහන් පද්ධතිවල වටිනාකම රු.8,475,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුවේ. | කාණ්ඩ අංක ලබාදීමට ප්‍රමාද වූ බැවින් ලේඛනගත කිරීමට අතපසු වූ අතර එය 2020 වර්ෂයේදී ලේඛනගත කිරීමට කටයුතු කරමි. |
| (x) | සමාලෝචිත වර්ෂයේදී බල ප්‍රදේශයේ ඉදිකරන ලද කසල ක්‍රමවත්ව බැහැර කිරීමේ ස්ථානවල වටිනාකම වූ රු.7,671,276 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසාන ගිණුම්වල ස්ථාවර වත්කම් යටතේ ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (xi) | විවිධ ව්‍යාපෘති හා නීති යටතේ පොළොන්නරුව මහා නගර සභාව වෙත භාරදී තිබූ ඉඩම් ගොඩනැගිලි හා වත්කම් අයිතම 05 ක වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම් හඳුනාගෙන ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතුවේ. | ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඉදිරි මස ඇතුලත සමීක්ෂණය අවසන් කර ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර 2020 අවසන් ගිණුමට ඇතුලත් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (xii) | පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් 2017 ජූනි මස ලබාදී කසල අපහරණ මධ්‍යස්ථානයේ ඇති රු.9,939,115 වටිනා උපකරණවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුවේ. | පත්කර ඇති සමීක්ෂණ මණ්ඩලය මඟින් ඉදිරි මස ඇතුළත සමීක්ෂණය අවසන් කර 2020 අවසන් ගිණුම් සඳහා ඇතුලත් කිරීමට කටයුතු කරමි. |
| (xiii) | 2017 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා මාසවලට අදාල හිඟ උසාවි දඩ මුදලින් පොළොන්නරුව මහා නගර සභාවට අයත් රු.2,573,110 ක මුදල වත්කම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ලබා දී ඇති පිළිතුර ඡේදයට අදාල නොවේ. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

--------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------- |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල උපලේඛනය අනුව ඉඩම් ගොඩනැගිලි වටිනාකම සහ ස්ථාවර වත්කම් ලේඛනය අනුව ඉඩම් ගොඩනැගිලි වටිනාකම අතර රු.8,351,406 ක නොසැසඳීමක් පැවතුණි. | සැසඳීම් කර නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. එය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල උපලේඛනය අනුව කර්මාන්ත ණයහිමි ශේෂය රු.35,798,649 ක් වුවත් එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව රු.69,456,205 ක් වූයෙන් රු.33,657,556 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන සමඟ නිවැරදි උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි. ප්රාදේශීය සභාව හා නගර සභාව අතර අනුපාතිකව බෙදාවෙන්කළ කර්මාන්ත ණයහිමි ශේෂ සඳහා වාර්තා සොයාගත නොහැකි බැවින් ණයහිමියන් හඳුනාගත නොහැක. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල උපලේඛනය අනුව කර්මාන්ත ණයගැති ශේෂය රු.30,124,998 ක් වුවත් එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව රු.54,034,762 ක් වූයෙන් 23,909,764 ක නොසැසඳීමක් විය. | මූල්‍ය ප්‍රකාශන සමඟ නිවැරදි උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ. | ප්‍රාදේශීය සභාව හා නගර සභාව අතර අනුපාතිකව බෙදා වෙන්කළ කර්මාන්ත ණයගැති ශේෂයට අදාල ණයගැතියන් හඳුනාගත නොහැක. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල උපලේඛනය අනුව විවිධ ණය හිමි ශේෂය රු.4,093,812 ක් වුවත් එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව රු.3,100,434 ක් වූයෙන් රු.993,378 ක නොසැසඳීමක් විය. | මූල්‍ය ප්‍රකාශන සමඟ නිවැරදි උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල උපලේඛන අනුව කලින් ලද ආදායම් ශේෂය රු.1,301,997 ක් වුවත් එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව රු.4,480,626 ක් වූයෙන් රු.3,178,629 ක නොසැසඳීමක් විය. | මූල්‍ය ප්‍රකාශන සමඟ නිවැරදි උපලේඛන ඉදිරිපත් කළ යුතුවේ. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.807,701,344 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනය සඳහා අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සමීක්ෂණය කර ස්ථාවර වත්කම් ලේඛන, ඉන්වෙන්ට්‍රි ලේඛන හා අනෙකුත් ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දක්වා ඇත. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- | --- |
| | | රු. | | | |
| (අ) | මහා නගර සභා ආඥා පනත | | | | |
| (i) | 35 හා 37 වගන්ති | | මහා නගර සභා ආඥා පනත අනුව පොළොන්නරුව මහා නගර සභාව වෙත පැවරී ඇති ඇතැම් උද්‍යාන, වීථි, පොදු ගොඩනැගිලි,ඉඩම්, වීථි ලාම්පු ආදි ඉඩම් හා වෙනත් දේපල හඳුනාගෙන වත්කම් ලේඛනවල ඇතුලත් | දේපළ හඳුනාගෙන වත්කම් ලේඛනවල ඇතුලත් කළ යුතුවේ. | පිළිගනිමි. ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩලයක් 2020.05.22 දින පත්කර ඇති අතර අදාල සමීක්ෂණය ඉදිරි මස තුළ අවසන් කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | කර නොතිබුණි. | | |
| (ii) | 247(අ) 2 වගන්තිය | - | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කල හෝටල් 08 කින් සියයට 1 දක්වා අයකල යුතු ගාස්තු අයකර නොතිබුණි. | ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ගාස්තුව අයනොවූ හෝටල් සඳහා ලිඛිතව සහ දුරකථන මාර්ගයෙන් දැනුම්දීම් සිදුකර ඇත. |
| (iii) | 253(1) වගන්තිය | 2,626,375 | කඩ කාමර 148 ක කඩකුලී ආදායම් රු.2,626,375 ක් හිඟව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීමට හෝ සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රකාරව කටයුතු කිරීම සිදුකළ යුතුවේ. | 2020 පෙබරවාරි වන විට වැඩි ප්‍රමාණයක් අයවී ඇත. මාර්තු, අප්‍රේල්, මැයි මාස සඳහා කොරෝනා වසංගත තත්ත්වය මත හිඟ මුදල් හා මාසික කුලිය අයකිරීම ආණ්ඩුකාර අනුමැතිය මත අත්හිටුවා තිබූ බැවින් නැවත අනුමැතිය ලද පසු හිඟ මුදල් අය කිරීමට කටයුතු කරමි. |
| (ආ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ඒකාබද්ධ සේවා චක්‍රලේඛ 02/2017 | | පුලතිසි බුද්ධි මණ්ඩප පුස්තකාල සමීක්ෂණය අනුව අස්ථානගත වූ බවට හඳුනාගත් පුස්තකාල පොත් 640 ක වටිනාකම රු.42,484 ක් හා නවනගරය පුස්තකාලයේ වටිනාකම හඳුනානොගත් පොත් 122 ක ඌනතාවය සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | පුස්තකාල පොත් අස්ථාන ගතවීම් හා ඌණතා සම්බන්ධ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | චක්‍රලේඛය ප්‍රකාරව අවශ්‍ය කටයුතු දැනටමත් සිදුකරමින් පවතින බව කාරුණිකව දන්වමි. |
| (ඇ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | | වාහන 23 ක අයිතිය මහා නගර සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතුවේ. | පවරා ගැනීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත. ඉදිරියේදී පොළොන්නරුව මහා නගර සභාව නමින් එකී වාහන 23 ලියාපදංචි කිරීමට හැකියාව සැලසෙනු ඇත. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | උතුරු මැද පළාත් පාලන කොමසාරිස් ගේ චක්‍රලේඛ<br>---------------- | | | | |
| (i) | එන්සීපී/එල්ජී/ 9/7/19 හා 1994.07.18 දිනැති පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය<br>--------------- | | | | |
| | 2 වගන්තිය | | වර්ෂ 05 කට වරක් කුලී තක්සේරු කල යුතු වුවද, සභාවට අයත් කඩ කාමර 151 ක් සඳහා 2007 වර්ෂයට අදාල තක්සේරු කුලිය අයකර තිබුණි. | නියමිත කාලය තුල තක්සේරු කර ඒ අනුව ගාස්තු අයකල යුතුවේ. | තාවකාලික තක්සේරුවක් සිදුකර 2020 වර්ෂයේ සිට කඩකුලී වැඩියෙන් අයකරගත් අතර 2019.10.09 දිනැති ලිපියෙන් කඩකාමර තකසේරු කිරීම සම්බන්ධව තක්සේරු දෙපාර්තමේන්තුව දැනුවත් කර ඇත. |
| (ii) | පළාත් පාලන කොමසාරිස් ගේ 2019 මාර්තු 25 දිනැති එන්සීපී/එල්ජී/ ඒසී/01 ලිපිය | | | | |
| | පැහැදිලි කිරීම් අංක 01 | | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය සකස් කර නොතිබුණි. | ඉඩම් ගොඩනැගිලි සමීක්ෂණ සිදුකර ස්ථාවර වත්කම් ලේඛන සකස් කල යුතුවේ. | ස්ථාවර වත්කම් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇති අතර ඉදිරි මස තුල සමීක්ෂණය අවසන් කර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීමට හා 2020 අවසන් ගිණුම් සඳහා ඇතුලත් කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | 2018 අගෝස්තු 29 දිනැති 2086/15 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී | 748,720 | ගැසට් නිවේදනයට පටහැනිව 2018, 2019 වර්ෂවල ගෙවා තිබූ, රු.748,720 ක දීමනා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | දීමනා නැවත අයකර ගැනීමට කටයුත කල යුතුවේ. | 2020.01.14 දින පැවති මහා සභා රැස්වීමේදී ගෙවූ දීමනා 2020 ජනවාරි මස සිට වාරික 12 කින් සභිකයින්ගෙන් අයකර ගැනීමට තීරණය විය. 2020 ජනවාරි සිට සභික දීමනාවෙන් ඉහත මුදල අයකර ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය | | කටයුතු යොදා ඇත. මියගිය නියෝජ්‍ය නගරාධිපතිගෙන් අයවිය යුතු මුදල ඔහුගේ දරුවෙකු විසින් ගෙවනු ලබන බවට තහවුරුවක් ලබාගෙන ඇති අතර එය අයකර ගැනීමට ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදුකරමි. |

**1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ගිණුම් ශේෂ ලෙස දක්වා තිබුණු අයකිරීමට තිබෙන වැඩ සඳහා රු.2,699,839 ක් දීර්ඝ කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පවතින අතර, එය හඳුනාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. පොළොන්නරුව ප්‍රාදේශීය සභාවෙන් අයවිය යුතු මුදලකි. නිවැරදි මූල්‍ය ප්‍රභවය හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ගිණුම් ශේෂ ලෙස දක්වා තිබුණු රු.997,128 ක පොදු සැපයුම් ණයහිමි ශේෂයක් දීර්ඝ කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පවතින අතර, එය හඳුනාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. ප්‍රාදේශීය සභාව හා නගර සභාව අතර අනුපාතිකව බෙදාවෙන්කළ කර්මාන්ත ණයහිමි ශේෂ සඳහා වාර්තා සොයාගත නොහැකි බැවින් ණයහිමියන් හඳුනාගත නොහැක. පළාත් පාලන ගණකාධිකාරි තුමන් සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු සිදුකරමි. |
| (ඇ) | 2018 වර්ෂයේ සිට සභාව වෙත අයවිය යුතුව තිබූ හිඟ එක්වන් මුදල් (කීමනි) රු.1,370,000 ක් අයකර නොගෙන හිඟ ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිගනිමි. අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට ගෙන ඇති බව කාරුණිකව දන්වමි. |
| (ඈ) | පොළොන්නරුව ප්‍රාදේශීය සභාවෙන් 2018 වර්ෂයේ සිට ලැබිය යුතු මුදල් රු.2,512,622 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පොළොන්නරුව ප්‍රාදේශීය සභාවෙන් ලැබිය යුතු මුදලකි. උපලේඛන නොමැත. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු.24,871,603 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.5,017,287 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|

(අ) නිශ්ක්‍රීය බැංකු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභාව පිහිටුවීමට පෙර සිට පැවති රු.629,587 ක ශේෂයක් සහිත බැංකු ගිණුම් 03 ක් නිශ්ක්‍රීයව පැවතුණි. | ඵලදායි කාර්යයක් සඳහා උපයෝජනය කළ යුතුවේ. | පිළිගනිමි. අදාල ගිණුම්වල මුදල ගිණුම් අහවර කර ලබාගැනීම සඳහා පොළොන්නරුව ප්‍රාදේශීය සභාවේ නිර්දේශය හා පළාත් පාලන කොමසාරිස් තුමියගේ අනුමැතිය ලබා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

2019 වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2019

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කල ආදායම | රැස්කල ආදායම් | දෙසැ. 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 23,507,188 | 19,906,477 | 15,770,299 | 19,133,917 |
| (ii) | කුලී | 18,823,558 | 7,706,622 | 6,503,056 | 2,626,375 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 7,200,000 | 5,127,000 | 5,127,000 | - |
| (iv) | වෙනත් ආදායම් | 13,000,000 | 10,116,550 | - | 40,015,201 |
| | එකතුව | 62,530,746 | 42,856,649 | 27,400,355 | 61,775,493 |

**2.3.2 වරිපනම් හා බදු**

**-----------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 වර්ෂයේ ආරම්භක හිඟ වරිපනම් ආදායම රු.12,233,286 ක්ද, 2019වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බිල්කල වරිපනම් ආදායම් රු.16,924,977 ක් ද ලෙස 2019 දෙසැම්බර් 31 දිනට රැස්කල යුතු ආදායම රු.29,158,263 න් රු.13,467,349 ක් රැස්කර තිබුණි. ඉදිරිපත් කල තොරතුරු අනුව හිඟ ආදායම් රු.15,690,914 ක් විය. | හිඟ වරිපනම් නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුවේ. | පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන යටතේ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය දේපලයන්හි මාර්ග සංවර්ධනය හේතුවෙන් කඩා ඉවත් කල දේපලයන්ට ද මේ වන තෙක් බිල්කර තිබුණු බැවින් මෙම හිඟයෙන් කොටසක් අයකිරීමට නොහැකි තත්ත්වයක පවතී. හිඟයෙන් රු.663,286 ක මුදලක් කපා හැරීමට මහා සභාවේ අනුමත වූ අතර, ඉදිරියේදී තවදුරටත් ඇති කඩා ඉවත් කල දේපල හඳුනාගෙන කපා ඉවත් කිරීමට කටයුතු සිදුකරමින් පවතී. |
| (ආ) වාර්ෂිකව අළුතින් එකතුවන වරිපනම් ඒකක හඳුනාගැනීමටත්, වරිපනම් අයකල හැකි දියුණු ප්‍රදේශ සඳහා වරිපනම් බදු පැනවීමටත් කටයුතු කර නොතිබුණි. | වරිපනම් අයකල හැකි ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් අයකල යුතුවේ. | 2018 වර්ෂය අවසානයේ තාවකාලික තක්සේරුවක් සිදුකල අතර තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලිපියක් මඟින් නව තක්සේරුවක් සඳහා ඉල්ලුම් කර ඇත. |

**2.3.3 කුලී**

**-----**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පොළොන්නරුව වට රවුම අසල දෙමහල් ගොඩනැගිල්ල 2019 මාර්තු සිට රු.50,000 ක මාසික කුලියට ලබාදීමෙන්, අයවිය යුතු බදු මුදල් හා වැට් රු.514,000 ක් විය. | හිඟ කුලී මුදල් අයකරගැනීමට කටයුතු කල යුතුවේ. | ගිවිසුම අත්සන් කර ඇත. මෙම හිඟ මුදල අයකිරීමට ඉදිරියේදී කටයුතු කරමි. |

**2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම්**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් | විගණන නිර්දේශ අනුව නිවැරදි හිඟය | 2019.12.05 දින වන විට උසාවි දඩ ආදායම රු.682,928 ක |

| | | |
|---|---|---|
| බලධාරීන්ගෙන් අයකරගත යුතු හිඟ උසාවි දඩ ආදායම රු.6,829,928 ක් බව මූල්‍ය ප්‍රකාශන මඟින් පෙන්වා ඇතත් හිඟ උසාවි දඩ ආදායම සංශෝධනය විය යුතුව තිබුණි. | හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ගිණුම් ප්‍රකාශ ලැබී ඇති අතර සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් දක්වා ගිණුම් ප්‍රකාශ 2020 වර්ෂයේ ලැබී ඇත. |
| (ආ) ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශන අනුව 2018 වර්ෂ අවසානයට හඳුනාගෙන තිබූ හිඟ මුද්දර ගාස්තු ආදායම රු.33,185,273 ක් වූ අතර 2019 වර්ෂයට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන නොතිබුණි. | හිඟ මුදල් ලබාගැනීමට හා නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයට අදාල ගිණුම් ප්‍රකාශ 2020.06.18 ලැබී ඇති අතර හිඟය රු.4,555,650 කි. |

**2.3.5 දූශ්‍ය අක්‍රමිකතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ක්ෂේත්‍රයේදී රැස්කරන ලද බලපත්‍ර ගාස්තු ආදායම් කාර්යාලයට බැඳීමේදී කුවිතාන්සියේ අනුපිටපත වෙනස් කර රැස්කල ආදායමට වඩා අඩු ආදායමක් අයකර තිබූ අවස්ථා 04 ක් අනාවරණය කරගෙන තිබූ අතර එහි වටිනාකම රු.8,750 ක් විය. | අදාල මුදල් අයකරගැනීම හා විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුවේ. | මේ සඳහා මූලික විමර්ශනය සිදුවෙමින් පවතී. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යසාධනය**

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම, පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබූ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරි සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව මහා නගර සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්ම සකසා ඇත. |

(ආ) තිරසර සංවර්ධන අරමුණු

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් හඳුන්වා දී තිබුණු තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව සභාව දැනුවත් වී තිබුණද, එම අරමුණු අතරින් සභාවට අදාල අරමුණු නිවැරදිව හඳුනාගෙන නොතිබුණු අතර, අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක සඳහා දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි. 2017, 2018 හා 2019 වර්ෂවල තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් හඳුනාගෙන නොතිබුණි. ඉලක්ක කරා ළඟාවීම සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ක්‍රමවේදයක් හා අරමුණු ඉටුකර ගැනීම සඳහා සම්බන්ධ කරගත යුතු අනෙකුත් රාජ්‍ය ආයතන හඳුනාගෙන නොතිබුණි. | සභාවට අදාලව අරමුණු හඳුනා ගැනීම, දත්ත එක්රැස් කිරීමේ ක්‍රමවේදයන් සැකසීම, මූල්‍ය ප්‍රතිපාදන කිරීම සම්බන්ධිත ආයතන හඳුනාගැනීම කළ යුතුවේ. | පිළිගනිමි. |

**(ඇ) අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබානොගැනීම**

**---------------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයෙන් ඉටුකිරීමට යෝජිතව තිබූ රු.15,100,000 ක් වටිනා සංවර්ධන ව්‍යාපෘති 24 කින් රු.12,100,000 කට ඇස්තමේන්තුගත ව්‍යාපෘති 22 ක් ඉටුකර නොතිබුණි. | අයවැය ලේඛනය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයෙහි සඳහන් ව්‍යාපෘති සංවර්ධන සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හරහා ඉදිරිපත් කර ඇත. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් නාගරික කොමසාරිස්, නියෝජ්‍ය නාගරික කොමසාරිස්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, පශු වෛද්‍ය නිලධාරී, නාගරික ඉංජිනේරු යනාදී තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු සම්බන්ධයෙන් විටින් විට අප කාර්යාලය විසින් සහ උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කර ඇත. |
| (ii) ද්විතියික මට්ටමට අයත් විවිධ තනතුරුවල පුරප්පාඩු 22 ක් හා තනතුරු 03 ක අතිරික්ත පැවතුණි. | අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු සම්බන්ධයෙන් විටින් විට අප කාර්යාලය විසින් සහ උතුරු මැද පළාත් පාලන |

| | | | |
|---|---|---|---|
| | | | දෙපාර්තමේන්තුව මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව දැනුවත් කර ඇත. |
| (iii) | ප්‍රාථමික මට්ටමට අයත් විවිධ තනතුරුවල පුරප්පාඩු 23 ක් හා තනතුරු 08 ක අතිරික්තයක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට හා අතිරික්ත විධිමත් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ප්‍රාථමික මට්ටමට අයත් පුරප්පාඩු සඳහා බඳවාගැනීමට 2019.08.27 දින මහා සභා තීරණය අනුව කටයුතු කරන ලද නමුත් මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ අංක DMS/POLICY/Recruitments හා 2019/11/20 හා DMS/CIR/2020 හා 2020.02.05 දිනැති චක්‍රලේඛ අනුව බඳවාගැනීම තාවකාලිකව අත්හිටුවීම මත මෙම බඳවාගැනීම් සිදුකිරීමට අපොහොසත්ව ඇත. |

**3.3 වත්කම් කළමනාකරණය**

**-------------------------**

**3.3.1 නිෂ්ක්‍රීය වත්කම්**

**-------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | ------------- |
| (අ) | ට්‍රැක්ටර් සංස්ථා ගොඩනැගිල්ල පිහිටා තිබූ ඉඩම, දැයට කිරුළ කඩකාමර හා පොළොන්නරුව සිටි සෙන්ටර් වාණිජ කටයුතු සඳහා භාවිතා නොකර මාස 06 සිට අවු. 06 අතර කාලයක් නිෂ්කාර්යව පැවතුණි. | ඵලදායිව උපයෝජනය කල යුතුවේ. | ට්‍රැක්ටර් සංස්ථා ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ හිමිකාරත්වය සම්බන්ධ අර්බුදය නිරාකරණය වූ විගස සංවර්ධන කටයුත්තක් සිදුකිරීමට සැලසුම් කර ඇත. දැයට කිරුළ කඩකාමර භාවිතා කිරීමට නොහැකි මට්ටමක පවතී. පිළිසකර කිරීම් අරඹා ඇත. අවසන් වූ පසු ටෙන්ඩර් කිරීමට කටයුතු කරමි. පොළොන්නරුව සිටි සෙන්ටර් මේ වන විට ටෙන්ඩර් කර ඇති අතර 2020 ජූලි මස ජනතාව සඳහා විවෘත කිරීමට කටයුතු යොදා ඇත. |
| (ආ) | මහා නගර සභාවේ කසල අපහරණ මධ්‍යස්ථානය තුල ඇති රු.10,743,000 ක් වටිනා යන්ත්‍රෝපකරණ 03 ක් වර්ෂ 01 – 05 අතර කාලයක සිට නිෂ්කාර්යව | ඵලදායිව උපයෝජනය කළ යුතුවේ. | ක්‍රියාත්මක කිරීමේ පිරිවැය ඉතා ඉහල අගයක් ගන්නා බැවින් භාවිතයෙන් ඉවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| | පැවතුණි. | | මෙම යන්ත්‍ර සඳහා ඉදිරියේදී සිදුකරනුයේ කුමක් ද යන වගට උතුරු මැද පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් විමසීම් කර ඇත. |

3.4 **මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහා නගර සභා නිල වෙබ් අඩවිය නිර්මාණය සඳහා සැපයුම්කරුවෙකු තෝරාගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රමවේදයන් විධිමත්ව අනුගමනය කර නොතිබූ අතර, මහා නගර සභාව විසින් එම වෙබ් අඩවියේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රමවේදයන් විධිමත්ව අනුගමනය කිරීමට හා වෙබ් අඩවියේ අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙය හදිසි අවශ්‍යතාවය මත කඩිනමින් සිදුකල යුතුවූ කාර්යයක් වූ බැවින් අතපසුවීමකින් ප්‍රසම්පාදන තීරණයන් සටහන් කිරීමට නොහැකි වී ඇති අතර හිමිකාරිත්වය පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි. |

## 4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිළධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් මාස 06 සඳහා පිළියෙල කරන ලද අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර ඒ අනුව අභ්‍යන්තර විගණනය සිදුකළ යුතුවේ. | පිළිගනිමි. 2020 වර්ෂය සඳහා විගණන සැලැස්ම සකසා ඇත. |
| (ආ) | අභ්‍යන්තර විගණක විසින් සීමිත ක්ෂේත්‍රයක සිදුකරන ලද විගණනයට අදාලව ඉදිරිපත් කරන ලද වාර්තාවල දැක්වෙන නිර්දේශ කළමනාකරණය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තාවල ඇතුලත් නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුවේ. | පිළිගනිමි. 2020 වර්ෂයේදී එම අඩුපාඩුව නිවැරදි කිරීමට කටයුතු කරමි. |